**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ගනුදෙනු පිළිබඳව විගණකාධිපති වාර්තාව- 2020**

---

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2019,2020 හා 2021 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. විගණන නිරීක්ෂණ

---

## 2.1 වත්කම් හා වගකීම්වල පැවැත්ම

---

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ,බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 7,476,170 |
| ජංගම වත්කම් | 154,219,287 |
| අනෙකුත් ජංගම වත්කම් | 561,941 |
| **මුළු වත්කම්** | **162,257,398** |

<u>ස්කන්ධය හා වගකීම්</u>

| | |
|---|---:|
| ස්කන්ධය | 49,798,341 |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 5,919,000 |
| ජංගම බැරකම් | 106,540,060 |
| | ---------------- |
| **මුළු බැරකම්** | **162,257,401** |
| | ========= |
| මුළු ආදායම | 33,245,125 |
| මුළු වියදම | 29,599,492 |
| | -------------- |
| **අතිරික්තය** | **3,645,633** |
| | ======== |

## 2.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 103, 104 හා 110 | (i). 2015 සිට 2019 කාලපරිච්ඡේදය තුල අධිකාරිය සතු රු.203,890 ක් වටිනා ලැප්ටොප් පරිඝණක දෙකක් හා රු.61,900 ක් වටිනා ටැබ් පරිඝණක යන්ත්‍ර දෙකක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 , 104 හා 110 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ඒ සම්බන්ධව මේ වන විට මූලික විමර්ශනයක් පවත්වා වැඩිදුර පරීක්ෂණ සඳහා කළමනාකාරීත්වයේ උපදෙස් මත නාරාහේන්පිට පොලිසියේ පැමිණිල්ලක් යොදා ඇත. මෙහි පොලිස් වාර්තාව මේ වන විටත් ලැබී නොමැත. පොලිස් වාර්තාව ලැබුණු විගස අවශය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වගබලා ගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii). PD-6379 අංක දරන කැබ් රථය සභාපතිවරයා විසින් ධාවනය කරමින් සිටින අවස්ථාවේ ජලය ප්‍රමාණවත්ව නොයෙදීම මත වාහනයේ එන්ජිමට හානි සිදු වී තිබුණි. ඒ පිළිබඳව මුදල් | මුදල ලබාදෙන ලෙස දන්වා ලියාපදිංචි තැපැලෙන් ලිපියක් යොමුකරන ලදී. එම ලිපියට මේ දක්වා පිළිතුරු නොලැබුණු නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අය කර ගැනීමට තීරණය කර ඇති මුදල අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රෙගුලාසි ප්‍රකාරව සිදු කරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව අළුත්වැඩියාව සඳහා වැය වූ රු.498,110 ක මුදල සභාපතිවරයාගෙන් අය කර ගත යුතු බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද එම මුදල අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) 2006 අංක 12 දරන මුද්දර බදු පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | වටිනාකම රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක් වූ මුද්දර ගාස්තු අයකල යුතු වුවද අවස්ථා 69 දී රු. 7,208,000 ක ගෙවීම් වලට අදාලව මුද්දර ගාස්තු අඩුකර ගෙන නොතිබුණි. | මෙහි පෙන්වා ඇති ගෙවීම් අවස්ථා 69 න් 68 ක් සඳහා මුදල් ලබාදෙන ලද්දේ උපාධිදාරී ව්‍යවසායක උද්‍යානය වැඩසටහන යටතේ උපාධිදාරීන් සඳහාය. නමුත් රු.25 මුද්දර ඇලවීමක් සිදුකර නොමැත. නමුත් ඉදිරියේදී මෙවැනි වැරදීම් නොවීමට කටයුතු කරනු ලැබේ. | අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත අනුව අධිකාරියේ පහත අරමුණ ඉටුකර ගැනීම කෙරෙහි 2020 වර්ෂයේදී ද අවධානය යොමුකර නොතිබුණි. | | |
| (i). පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම. | Business delegation යන වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින් විදේශ තාක්ෂණය රටට ගෙන ඒමටත් දේශීය ව්‍යසයකයා ජාත්‍යන්තරය ගෙනයාමටත් ක්‍රියාකරන ලදී. පසුගිය වසරවල මෙම කාර්ය සඳහා Canton (china) වැනි ජාත්‍යන්තරය වෙළඳ ප්‍රදර්ශන සඳහා දේශීය ව්‍යසයකයන් සහාභාගි කරවන ලදී . විශේෂයෙන්ම 2019 වසරේ සිට “Made in Sri Lanka ” වෙළඳ ද්වාරය තුලින් දේශීය නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන දේශීය | පනතේ අරමුණු ඉටු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වෙළඳපොලට මෙන්ම විදේශීය වෙළඳපොල වෙත ගෙන යාමට හැකියාව ඇති අතර ඒ තුලින් තම නිෂ්පාදන අලෙවි කර ගැනීමට අවස්ථාව උදා වෙයි. තවද අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන “Made in Sri Lanka ” වෙළඳ සල්පිල් දේශීය මෙන්ම විදේශීය වෙළඳපොල අවස්ථා ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන අතර තම දේශීය නිෂ්පාදන සංචාරකයින් වෙත යොමු වීම තුල ජාත්‍යන්තරව අලෙවි සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම “Made in Sri Lanka ” බලයලත් අලෙවිසල් ලංකාවේ පිහිටුවීමට අධිකාරිය සැලසුම් කර ඇති අතර මේ තුලින් දේශීය නිෂ්පාදකයින් ඍජුවම විදේශ වෙළඳ සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හේතු කාරක වනවා මෙන්ම වෙළඳපොල අවස්ථා උදාකර දෙයි. | |
| (ii). | තාක්ෂණික දියුණුව , නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම. | තාක්ෂණික සංවර්ධන අරමුදල ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වන ජර්මානු ව්‍යාපෘතිය (GIZ) හා එක්ව කටයුතු කරන අතර එම තාක්ෂණික සංවර්ධන අරමුදල පිහිටුවිම සඳහා එම ආයතනය විශාල මුදලක් ඉල්ලා සිටි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට (එවකට සිටි) හා අමාත්‍යංශයට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ඒසඳහා අනුමැතියක් නොලැබුනු නිසා එම අරමුදල පිහිටුවීමට නොහැකිවිය. නමුත් ආයතනය විසින් ප්‍රාදේශී ය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන තුලින් ව්‍යවසායකයන්ගේ තාක්ෂණික දියුණුව, නිෂ්පාදනය සංවර්ධනය සහ පේටන්ට් අයිතිය ලබාගැනීම යන අවස්ථාවන් ව්‍යවසායකයන් හට උදාකර දි තිබේ. තවද : “Made in Sri Lanka ” වෙළඳ ද්වාරය තුලින්ද ව්‍යවසායකයන්ගේ තාක්ෂණික දියුණුව, නිෂ්පාදනය සංවර්ධනය | පනතේ අරමුණු ඉටු කර ගත යුතුය. |

යන කාර්යන් ඉටුකරනු ලැබේ. තවද ව්‍යවසායකයන්ගේ තම නිෂ්පාදන සඳහා පර්යේෂණ හා සංවර්ධනය වැඩසටහන් මාකඳුරේ පිහිටුවා ඇති පෙර වැඩුම් මධස්ථානය මගින් ඉටුකරවා ගත හැක .

## 3.2 අත්තිකාරම් පාලනය

----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලබා දුන් අත්තිකාරම් මුදල් වැය නොකර දින 22 සිට දින 148 දක්වා කාලයක් රඳවාගෙන සිට සම්පූර්ණ මුදලම පියවා තිබුණු අවස්ථා 05 ක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු.537,400 ක් විය. | 2020 වර්ෂයේ පැතුරුණු කොරෝන වසංගතය හේතුවෙන් සැලසුම් කරන ලද සමහර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. මෙහි පෙන්වා ඇති වැඩසටහන් ද කොරෝන වසංගතය නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. එම නිසා ලබාදෙන ලද මුදලම නැවත පියවීමට සිදුවිය. පියවීම සඳහා යම් කාලයක් ගත වී ඇත්තේ කොරෝන වසංගතය හේතුවෙන් කාර්යාල නිසි කලට වෙලාවට පවත්වා ගෙනයාමට නොහැකිවීම හේතුවෙනි. | වියදම නිවැරදිව ඇස්තමේන්තු කර අත්තිකාරම් ලබා දිය යුතු අතර, අදාල කාර්ය ඉටු නොවන්නේනම් ලබාගත් අත්තිකාරම හැකි ඉක්මනින් පියවිය යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ ලබා දුන් රු.372,281 ක් ද , 2018 වර්ෂයේ ලබා දුන් රු.1,939,410 ක් ද, 2019 වර්ෂයේ ලබා දුන් රු.1,862,852 ක් ද වූ අත්තිකාරම් විගණිත දිනය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයට අදාලව පියවීමට ඇති අත්තිකාරම් වල වටිනාකම් රු.372,281 ක්ද, 2018 වර්ෂයට අදාලව පියවීමට ඇති අත්තිකාරම් වල වටිනාකම රු. 1,939,410.00 ක්ද වී තිබූ අතර මෙම අත්තිකාරම්ද ලබාදී ඇත්තේ ප්‍රදේශීය ලේකම් කාර්යාලවලට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහාය. 2019 වර්ෂයට අදාලව පියවීමට ඇති අත්තිකාරම් වල වටිනාකම රු 1,862,852 කි. ඉහත සඳහන් අත්තිකාරම් පියවීමට අදාල ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඉදිරි ගිණුම් වර්ෂවලදී අත්තිකාරම් ගිණුම ශුන්‍ය අගයක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | නිලධාරියෙකුට ලබා දුන් අත්තිකාරම් මුදලක් දෙන ලද කාර්ය නිමකල විගසම පිය වන බවට වගබලාගත යුතුය. |